# ගමේ සැලසුමයි

# රටේ අනාගතයයි

ප්‍රාදේශීය සංවර්ධනය යන අද හස මැතක සිට ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීමේදී ඉතාමත් වැදගත් ස්ථානයක් ගෙන තිබෙන බව ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු විමසා බලන්නකුට පැහැදිලිවම පෙනෙන දෙයකි. ශ්‍රී ලංකාවට නිදහස ලැබුනු දා සිටම ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති බොහෝ විට තීරණය කරණ ලද්දේ ජාතික මට්ටමෙනි. මුළු ආර්ථිකයම සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂ කීපයක් සඳහා රජයේ සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම ජාතික සංවර්ධන සැලැස්මෙකින් කෙරෙන අතර මෙහිදී ආර්ථිකය අංශිය වශයෙන් කොටස් කර ආර්ථික ප්‍රතිපත්ති සකස් කරන අතර ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු නො කරයි. පසුගිය දශක කීපය තුළ ක්‍රියාත්මක කරන ලද සය අවුරුදු සැලැස්ම දස අවුරුදු සැලැස්ම පස් අවුරුදු සැලැස්ම වැනි ආර්ථික සැලසුම් හුදෙක් ලේඛන වලට පමණක් සීමා වූයේ ශ්‍රී ලංකාවට ගැලපෙනෙ අන්දමට මෙම ප්‍රතිපත්ති සකස් නොවීමත් ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකිරීමත් නිසයි.

දියුණු වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව තවමත් කෘෂි කාර්මික රටකි. ශ්‍රී ලංකාවේ මුළු දළ ජාතික නිෂ්පාදිතයෙන් 25% ක් කෘෂිකර්මයෙන් ලැබෙන අතර මුළු සේවා නියුක්තියෙන් 50% ක්ම කෘෂි අංශයෙහි නියැලී සිටිති. මුළු වෙළෙඳ අපනයන වලින් 65%ක් කෘෂි අංශයෙන් ලැබේ. ඒ අනුව බලන විට ශ්‍රී ලංකාව කෘෂි අංශයද දියුණු වතු වැවිලි අංශය හා සම්ප්‍රදායික කෘෂි අංශය වශයෙන් කොටස් දෙකකට බෙදී ආර්ථිකයේ ද්විත්ව ස්වරූපයක් දක්නට ලැබෙන අතර රටේ මුළු ජනගහණයෙන් 70%ක් පමණ තව දුරටත් ග්‍රාමීය අංශයෙහි වාසය කිරීමද විශේෂ ලකුණකි. මේ නිසා ශ්‍රී ලකාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති තීරණය කිරීමේදී. වැඩි අවධානය යොමු කළ යුත්තේ ග්‍රාමීය අංශයටයි.

රටක සංවර්ධන ප්‍රතිපත්තියකින් අපේක්ෂා කරන්නේ රටේ දළජාතික නිෂ්පාදිතය ඉහළ දැමීමෙන් පමණක්ම රටක ආර්ථික සංවර්ධනය ඇතිකළ නොහැක. ප්‍රමාණාත්මක වශයෙන් රටේ ජාතික නිෂ්පාදිතය වැඩිකළ පමණින් රටක් දියුණු නොවන බව එක්සත් ජාතීන්ගේ දෙවැනි සංවර්ධන දශකයෙන් පසු අවබෝධ කරගත් නිසා ලෝකයේ බොහෝ රටවල් තම ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේදී වැඩි අවධානයක් යොමු කිරීමට පටන් ගත්තේ රටක දළ ජාතික නිෂ්පාදිතය ඉහළ නංවන ගමන්ම රටේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් (Basic Needs) ඉහළ දැමීම සඳහායි. ආහාර, නිවාස, ඇඳුම්, සෞඛ්‍ය ජලය අධ්‍යාපනය වැනි මිනිසකුට ජීවත් වීමේදී අත්‍යාවශ්‍ය වන සාධක යම්කිසි ආර්ථිකයක ඉහළ මට්ටමකින් සපයන්නේ නම් එම රට දියුණු ආර්ථිකයකි. අද ලෝකයේ තෙල් අපනයන කරන රටවලට ඉතාමත් ඉහළ ජාතික නිෂ්පාදිතයක් ඇතත් එම රටවල මූලික අවශ්‍යතාවයන් සැපයීම පහත් මට්ටමක පවතී. මේ නිසා එම රටවල ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් ලබාදීම සඳහා ප්‍රතිපත්ති සකස් කරනු ලබයි. මෙවැනි තත්වයක් යටතේ ආර්ථික සංවර්ධනය යනු ඉතාමත් බැරෑරුම් කටයුත්තක් නිසා බොහෝ දියුණු වන රටවල් තම ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේදී රටේ ජනතාවගේ අවශ්‍යතා කෙරෙහි වැඩි අවධානයක් යොමා ඇත. මේ නිසාම ප්‍රදේශයේ සැලසුම් කරණය යන්න අද තෙවැනි ලෝකයේ රටවල ඉතා ජනප්‍රිය වී ඇත. බොහෝ විට තෙවැනි ලෝකයේ රටවල දක්නට ඇත්තේ ඒකාකාරී ආර්ථික ලක්ෂණයකි. එනම් මෙම රටවල් සංවර්ධනය වෙමින් පවතින අතර ලබන්නා වූ සංවර්ධනයද ප්‍රදේශ කීපයකට පමණක් සීමා වී පවතී. මේ අනුව බොහෝ දියුණු වන රටවල ද්විත්ව ආර්ථික රටාවක් දැකිය හැක. එකම ආර්ථිකය තුළ දියුණු වාණිජ අංශයක් හා නොදියුණු සම්ප්‍රදායික අංශයක් මෙම ද්විත්ව ආර්ථික රටාව තුළින් දැකිය හැක. මේ නිසා ආර්ථිකය දියුණු වන විට සංවර්ධනයේ වැඩිදියුණු නාගරික අංශයට වැඩියෙන් ලැබෙන අතර නොදියුණු සම්ප්‍රදායික අංශය එම නිසා තවත් දුෂ්කරතා වලට මුහුණ පායි. මෙම කරුණ නිසා බොහෝ දියුණුවන රටවල් ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති කරණය කිරීමේදී ප්‍රාදේ



රටේ නියම දියුණුව: ගම්බද ජනතාවටත් සංවර්ධනයේ පල ලැබිය යුතුයි.

ශීය සංවර්ධන සැලසුම් කෙරෙහි විශේෂ අවධානයක් යොමා ඇත. දකුණු ඇමරිකානු රටවල් මෙන්ම කොරියාව,තායිවානය වැනි අර්ධ සංවර්ධිත රටවල්ද මෙම ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගෙන ඇත.

නවදුරටත් නොදියුණුවන රටක් වශයෙන් සලකන ශ්‍රී ලංකාවේ බොහෝ නොදියුණු ආර්ථික ක්‍රමවල දූකිය නොහැකි සුවිශේෂ ලක්ෂණ කීපයක් තිබේ. ඇත්ත වශයෙන්ම දළ ජාතික නිෂ්පාදිතය ශ්‍රී ලංකාවේ සංවර්ධනය මනින එකම මිනුම වශයෙන් අප සලකන්නේ නම් ශ්‍රී ලංකාව ලෝකයේ තිබෙන ඉතාම දුප්පත් රටවලින් එකකි. එහෙත් ලෝකයේ දියුණු රටවලට නොදෙවනි ආකාරයේ ඉහළ සෞඛ්‍ය මට්ටමක්, ඉහළ අධ්‍යාපන මට්ටමක් ශ්‍රී ලංකාවේ පවතී. ආහාර අතින් බලන විටද අනෙකුත් නොදියුණුරටවල දැකිය හැකි ආකාරයේ මන්ද පෝෂණයක් දැකිය නො හැක. මේ තත්වය යටතේ ශ්‍රී ලංකාව දියුණු රටක් වශයෙන් පවා හැඳින්වීමට ඇතැම් අර්ථ ශාස්ත්‍රඥයන් පෙළඹ සිටී. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන මේ තත්වය යටතේ වර්තමානයේ සංවර්ධන සැලසුම් සකස් විය යුත්තේ ආදායම් විෂමතාවය නැති කිරීම, ග්‍රාමීය ආර්ථික අංශය ඉහළ දැමීම, හා ජනතාවගේ අදායම් මට්ටම ඉහළ දූමීම වැනි ඉලක්ක මතයි. ග්‍රාමීය මට්ටමින් සැලසුම් ක්‍රියාත්මක කොට ග්‍රාමීය ජනතාවටද සංවර්ධනයේ ප්‍රතිලාභ බෙදීයන ආකාරයෙන් ආර්ථික ප්‍රතිපත්ති සකස්වීම මේ නිසා ඉතාමත් අත්‍යවශ්‍යවී තිබේ. එසේ කිරීමෙන් ආර්ථිකයේ වැඩි අංශයක් නියෝජනය වන ග්‍රාමීය කෘෂිකාර්මික අංශය ඉහළ දූමීමටත් ග්‍රාමීය සම්පත් නිසි ලෙස උපයෝජනය කිරීමට අවස්ථාව සැලසේ.

ශ්‍රී ලංකාවට ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියක් අවශ්‍ය වී ඇත්තේ ඇයිද ? යන්න විමසා බැලිය යුතු කරුණකි. ඉහත සඳහන්කළ ආකාරයට ඌණ සංවර්ධිත රටක් වන ශ්‍රී ලංකාවේ දූකිය හැක්කේද බොහෝ ආසියාතික ඌණ සංවර්ධිත රටවල දූකිය හැකි පොදු ලක්ෂණ කීපයකි. මේ නිසා දකුණු කොරියාව, තායිවානය, සිංගප්පූරුව වැනි රටවල් මෙන් ඉතා ඉක්මනින් ආර්ථික සංවර්ධනයක් ලැබීමට නම් මුළු ආර්ථිකයම ඉදිරියට තල්ලු කරන ආකාරයේ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක විය යුතුය. මෙහිදී ආර්ථිකයේ වැඩි කොටසක් නියෝජනය කරන ග්‍රාමීය අංශය ඉහළ දැමීමට නම් ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් ඉතාමත් අවශ්‍යය. අනෙක් අතට ශ්‍රී ලංකාවේ දැකිය හැකි ද්විත්ව ආර්ථික රටාව බිඳ දැමීම සඳහාද යොදාගත හැකි ප්‍රධාන උපක්‍රමය වන්නේ ප්‍රාදේශීය සංවර්ධනයයි. එසේම නිද

හස ලැබූ පසු මෙතෙක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති මගින් වැඩිපුර වාසි ලැබී ඇත්තේ දියුණු නාගරික අංශයට නිසා ජාතික ආදයම විෂම ලෙස බෙදී යාම වැලැක්විය හැක්කේද ප්‍රාදේශීය සැලසුම් කරණයෙන් පමණකි.

දියුණු වූ අංශයටම එනම් දියුණු නාගරික අංශය වෙතටම ආර්ථිකයේ ප්‍රතිලාභ ගලායන විටද එම ප්‍රදේශවල වෙනත් ප්‍රශ්න දක්විය හැක. උදහරණයක් වශයෙන් කොළඹ, ගාල්ල වැනි දියුණුවූ නගරවල අධික ජනගහණයක් සංකේන්ද්‍රනය වීමෙන් නිවාස තදබදය, ජලය විදුලි බල ප්‍රශ්න හා නොයෙක් සමාජ ආර්ථික ප්‍රශ්න ඇතිවී ඇත. මෙම ප්‍රශ්න විසදිය හැකි එකම මාර්ගය නම් ප්‍රාදේශීය සංවර්ධන ක්‍රම මගින් රටේ සම්පත් නොදියුණු අංශ කරා යොමු කිරීමයි.

මෑතක් වන තෙක්ම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සීමා වී තිබුනේ කොළඹ හා අවට ප්‍රදේශ අතරින් ගාල්ල, මහනුවර වැනි දිස්ත්‍රික්ක කීපයක් සඳහාත් පමණි. මේ කරුණු නිසා ආර්ථිකයේ ප්‍රශ්න කීපයක් ඇතිවිය.

1. කොළඹ ප්‍රදේශයේ ජනගහණය ඉහළ යාම. මේ හේතුව නිසාම කොළඹ හා එය අවට ප්‍රදේශවල ඉඩම් හා නිවාසවල මිළ ගණන් ඉතා අධික ලෙස ඉහළ යෑමක් සිදුවිය.

2. ජලය, විදුලි බලය වැනි අවශ්‍යතාවයන් නිසි ලෙසත් ප්‍රමාණවත් ලෙසත් සැපයීමට අපහසු වීම.

3. ගම්බද ප්‍රදේශවල තිබෙන සම්පත් නිසිලෙස ප්‍රයෝජනයට නොගැනීම.

4. ගම්බද ප්‍රදේශවල සිටි උගත් හා ශක්තිමත් ජනතාව රැකියා බලාපොරොත්තුවෙන් නාගරික ප්‍රදේශ කරා ඇදීඒම.

5. ගම්බද සේවා වියුක්තිය ඉහළ යාම.

නිදහස ලැබූ පසු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ප්‍රතිපත්ති මගින් ප්‍රාදේශීය සංවර්ධනය හා ග්‍රාමීය ආර්ථිකය ඉහළ දැමීම සඳහා සෘජු ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකළත් එම සැලසුම් වලින් අපේක්ෂා කරනු ලැබුවේ ජාතික වශයෙන් ක්‍රියාත්මක වන සංවර්ධන ප්‍රතිපත්ති මගින් ග්‍රාමීය ආර්ථිකයද දියුණු කිරීමයි. එහෙත් ප්‍රාදේශීය සංවර්ධන ආර්ථික ප්‍රතිපත්තියක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබුවේ 1971 න් පසු ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ක්‍රමය යටතේ ග්‍රාමීය සම්පත් නිසිලෙස උපයෝජනය කිරීමට අපේක්ෂා කළ අතර ගම් මට්ටමින් සැලසුම් සකස් කිරීමටත් පියවර ගනු ලැබීය. දිවයින පුරා ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල 2619 ක් ආරම්භ කිරීමට එවකට සිටි රජය අපේක්ෂා කළත් ඉන් ආරම්භ කිරීමට හැකිවූයේ 953 ක් පමණි. ප්‍රාදේශීය සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම, ග්‍රාමීය සේවා වියුක්තිය අඩු කිරීම වැනි ප්‍රතිඵල මේ යටතේ අපේක්ෂා කළත් ප්‍රාදේශීය සංවර්ධන මංඩල ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වූයේ නැත. ඉන් පසු 1974 දේශපාලන අධිකාරී ක්‍රමය යටතේ පරිපාලනය විමධ්‍යගත කිරීමත් අයවැය මගින් ප්‍රාදේශීය දියුණුව ඉක්මන් කිරීමත් අපේක්ෂා කරනු ලැබීය. 1977 ආංඩු වෙනස් වීමත් සමගම දේශපාලන අධිකාර ක්‍රමය අහෝසි කොට ඒ වෙනුවට දිසා ඇමති ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය. මේ යටතේ දිස්ත්‍රික්ක 24 ක් සඳහා දිසා ඇමතිවරුන් 24 දෙනෙක් පත්කළ අතර සෑම දිස්ත්‍රික්කයකම සංවර්ධන ක්‍රියාවලිය දිසා ඇමතිතුමා යටතේ පාලනය විය. මෙහිදී ප්‍රදේශයේ දිසාපති දිසා ලේකම් වශයෙන් කටයුතු කරනු ලැබීය. 1978 සිට ක්‍රියාත්මක වූ දිසා ඇමති ක්‍රමය යටතේ අපේක්ෂා කරනු ලැබුවේ දේශපාලන අධිකාරි ක්‍රමය කාර්යක්ෂම කිරීමටත් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම විෂමතාවයන්ගෙන් තොරව දියුණු කිරීමටත්ය. මෙහි තිබූ තවත් පරමාර්ථ දෙකකි.

1. මෙතෙක් ලංකාව තුළ ක්‍රියාත්මක වූ සංවර්ධන යෝජනා ක්‍රම වලින් පැන නැගුණු අඩු පාඩු මින් ඉදිරියට ඇති නොවීමට ක්‍රියාකිරීම.

2. නිලධාරි පාලනයට වඩා ජනතා සහයෝගයෙන් සංවර්ධන ප්‍රතිපත්ති තීරණය කිරීම.

1980 න් පසු ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සහා ක්‍රමයෙන්දරජය බලාපොරොත්තු වූයේ ග්‍රාමීය මට්ටමෙන් සැලසුම් සකස් කොට ග්‍රාමීය සම්පත් නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමයි. මීට අමතරව ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වර්තමානයේ ක්‍රියාත්මක කරන තවත් ප්‍රතිපත්තියක් නම් ගම් උදව සංකල්පය යටතේ ක්‍රියාත්මක වන උදගම් ව්‍යාපාරයයි. එසේම ලෝක බැංකු ආධාර යටතේ දිවයිනේ දිස්ත්‍රික්ක කීපයක ක්‍රියාත්මක කරනු ලබන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම යටතේද ප්‍රාදේශීය සංවර්ධනය සඳහා විශාල මුදලක් ආයෝජනය කොට ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමෙන් ග්‍රාමීය සම්පත් නිසිලෙස උපයෝජනය කළහැකිවීම, ග්‍රාමීය සේවා වියුක්තිය විසඳීම, ආර්ථික සංවර්ධනය රටපුරා විෂම ලෙස පැතිරීම වැලැක්වීම හා ග්‍රාමීය ආර්ථිකය ඉහළ දැමීම වැනි අභිමථාර්ථ යන් පහසු ලෙස විසඳා ගැනීමට හැකිවනු ඇත.

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි
**මහින්ද හේනේගෙදර**